# 10 සාහිත්‍යය

**කිසියම් වින්දයක් ලබාදෙන නිර්මාණාත්මක ලේඛනගත සියලු දේ මෙන්ම මුඛ පරම්පරානුසාරයෙන් පැවත එන ජනවේද සාහිත්‍යය නමින් හැඳින්වේ. ගද්‍ය සාහිත්‍යයටත් වඩා පද්‍ය සාහිත්‍යය කාන්ත ගුණයෙන් උසස් තැනක් ගනී. සිතෙහි උපදින භාවයන්, ඒ සැටියෙන් ම ප්‍රකාශ කිරීමට භාෂාවේ වචන ම ප්‍රමාණවත් නොවේ. කවියේ අර්ථයෙන් ප්‍රකාශ කරන හැඟීම්, පද සංඝටනයෙන් නගින හඬ වහල් කර ගැනීමෙන් උද්දීපනය කෙරේ. සමස්තයක් වශයෙන් ගත් කල, උසස් පද්‍යයක අර්ථ රසය හා ශබ්ද රසය එකිනෙක වෙන් නොකළ හැකි ලෙස ඒකාබද්ධ ව පවතී. ඡන්දස උපයෝගී කොටගෙන රචිත වූයේ පද්‍යයයි. එයින් තොර වූයේ ගද්‍යයයි. ගද්‍ය පද්‍ය දෙකෙහි මිශ්‍රණයෙන් රචනා කරන ලද්දේ චම්පූයි.**

රසවත් නිර්මාණ හැඳින්වීම උදෙසා, කාව්‍යය යන නාමය ද භාවිත වේ. රසාත්මක වාක්‍යය කාව්‍යය යනුවෙන් ද දැක්විය හැකි ය.

කාව්‍යයක ශබ්ද රසය නිපදවීම සඳහා වෘත්තය, ලය, අනුප්‍රාසය, එළිවැට හෙවත් එළිසමය උපකාර වේ. එමගින් ශබ්ද ධ්වනිය ඇති වේ. මෙහි වෘත්තය යනු විරිතයි. ඡන්දස යනු ගුරු-ලුහු මාත්‍රා නියමයයි. ඡන්දසෙහි විවිධ කොටස් ඇත. ඒවා විරිත් ලෙස හැඳින්වේ. සිංහලයේ 'රැඳි' නම් ඡන්දසට අයත් වන විරිතක් නම් සමුදුරුගොස් විරිතයි. කනට මිහිර දනෙන සේත්, අරුත් රසය මතු වන සේත්, අලුත් අලුත් විරිත් තනාගැනීම කවියාගේ දක්ෂතාව අනුව කළ හැක්කකි. වෑත්තෑවේ හිමියෝ විවිධ විරිත් යෙදීමෙන් ගුත්තිල කාව්‍යයේ විවිධ අවස්ථා, විවිධ සිද්ධි ගැන අපූරු කවි සිතුවම් මැවීමට සමත් වූහ.

රූ රුසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක් වන ලෙසේ වෙණ නාදනූ පා තබා
කම් පසේ දෙන සැර ලෙසේ දෙස බල බලා නෙතගින් සබා
මම් කෙසේ පවසම් එසේ වර සුර ළඳුන් දුන් රඟ සොබා

මෙහි විරිතත් උචිත පද මාලාවත් නිසා මනහර නැටුමක සිත්තමක් සහෘදයාගේ මනැසෙහි අපූරුවට ඇඳේ.

**ලය**

තාලයට ගැයෙන ගීයක් අසමින් රස විඳින තැනැත්තා නො දැනුවත් ව ම, ඒ අනුව හිස සොලවයි; ඇතැම් විට පයින් බිමට තට්ටු කරමින් හෝ තාලය අල්ලයි. එසේ කිරීමට පෙලඹ වූ කවියේ තාලය 'ලය' නම් වේ. එය රිද්මය යනුවෙන් ද හැඳින්වේ. සැළලිහිණි සන්දේශයෙන් ගත් මේ කවිය කියවා බලන්න.

සන් නන් සිහින් ගෙඳි සෙවණලු වැලි තෙලෙන
තැන් තැන් වල ම සැතපී සියුමැලි බැවින
රන් වන් කරල් ගෙන එන ගිරවුන් අතින
යන් මන් තොසින් මඟ තොරතුරු නියම දන

## ශබ්ද රසය හා අර්ථ රසය

ශබ්දය නිසා ඇති වන රසය ශබ්ද රසයයි. අර්ථය නිසා ඇති වන රසය අර්ථ රසයයි. එයින් අර්ථ රසය වඩා වැදගත් වෙයි. ශබ්ද රසය වූ කලි අර්ථය ප්‍රකට කිරීම සඳහා භාවිත කරනු ලබන සැරසීමක් පමණි. පුරාණ ආලංකාරිකයන්ගේ මතය අනුව කාව්‍යයෙහි ශෘංගාර, හාස්‍ය, කරුණ, රෞද්‍ර, වීර, භයානක, බීභත්ස, අද්භූත, ශාන්ත යයි රස නවයෙකි. එය නවනළු රස නමින් හැඳින්විණි. දස වැනි රසය ලෙස ඇතැමුන් දක්වන වත්සල නමින් ද රසයක් වේ. කුමාරතුංග මුනිදාස මහතා දක්වන පරිදි කුහුලුරු, (කුහුල), නුවළු (කලකිරීම) උවහස (උපහාසය) ය යි තවත් රස තුනක් වේ.

රස යන පදය සිය දහස් වර අපගේ කනට වැටී ඇතත් එය කුමක් දැයි සාර්ථක ලෙස විස්තර කළ නො හැකි ය. ඉදුණු අඹ ගෙඩියක රසය තවත් කෙනකුට පහදා දිය නො හැකි ය. එහි රසය හඳුනාගැනීමට නම් අඹ ගෙඩියක් අනුභව කොට ම, එය වටහාගත යුතු ය. එමෙන් ම වින්දනය මඟින් ම රසය හඳුනාගත යුතු ය.

සාහිත්‍ය රසය යනු ද එසේ ම ය. එය හඳුනාගැනීමට නම්, උසස් සාහිත්‍ය කෘති නිතර නිතර කියවිය යුතු ය.

කාව්‍යයක අර්ථ රසය වැඩි කිරීම පිණිස ම කවියා උපමා, රූපක, උත්ප්‍රේක්ෂා, වක්‍රෝක්ති ආදි අලංකාර ක්‍රම උපයෝගි කරගනී.

අලංකාර නම් සැරසීමයි. සිරුරක් සැරසීම සඳහා ආභරණ උපයෝගී කරගනු මෙන් කාව්‍යයක් සැරසීම සඳහා අලංකාර උපයෝගී කරගනී. ශබ්දය සරසන අලංකාර ශබ්දාලංකාර යනුවෙන් ද, අර්ථ සරසන අලංකාර අර්ථාලංකාර යනුවෙන් ද හැඳින්වේ. අනුප්‍රාස, එළිසමය ආදිය ශබ්දය සරසන හෙයින් ශබ්දාලංකාර නම් වේ.

### අනුප්‍රාසය

අකුරක් හෝ ශබ්දයක් හෝ පදයක් හෝ පුනපුනා යෙදීම අනුප්‍රාසය නම් වේ.

ඉඳ ඉඳ එක වෙහෙර  
විඳ විඳ දහම් මනහර  
සිඳ බිඳ දුක් සසර  
අනේ දෙව්දත් නුදුටි මොක්පුර

ගුත්තිල කාව්‍යයේ එන මේ කවියේ ඉඳ ඉඳ, විඳ විඳ යන පදවලින් නැඟී එන්නේ රසබර අනුප්‍රාසයකි.

### එළිසමය

පද්‍යයෙක එක් එක් පාදයෙහි මුල, මැද, අග යන සැම තැන්හි ම හෝ ඉන් එක් තැනෙක හෝ සමාන අකුරුවලින් අවසන් වන පද යෙදීම එළිසමය හෙවත් එළිවැට නම් වේ.

පැහැසරණි ය මිණි පැමිණි ය කොත් අගට  
බඳ කිකිණි ය දද ගිහිණි ය විමන් වට  
නොව පැරණි ය වන රමණි ය විටින් විට  
සැළලිහිණි ය වදු කැලණි ය පුර වරට

මෙසේ කවියාගේ දක්ෂකම අනුව ඉබේ මෙන් මතු වන එළිසමය කවියට අලංකාරයකි.

### උපමාලංකාරය

යම් කිසි වස්තුවක් තවත් වස්තුවක් මෙනැයි කීම උපමාවයි. උපමා කරනු ලබන වස්තුව උපමේය නම් වේ. මෙහි තඹුරුපෙති යනු උපමාවයි. නෙත් යනු උපමේයයි.

රැගත් සුරා පිරූ විතින්
සුරත් **තඹුරු පෙති සෙ** නෙතින්
පුවත් නො දැන බමන ගතින්
නටත් අයෙක් සුරා මතින්

### රූපකාලංකාරය

උපමාව හා උපමේය යන දෙක ම එකක් ලෙස සැලකීම රූපකාලංකාරය යි. රූපක යනු සැඟවුණු උපමාවයි. මෙන්, සේ, වැනි, බඳු, අයුරු, එව් ආදි සමානවාචී නිපාත පද භාවිත නො කොට ඍජු ව ම වස්තු දෙක ම එකක් සේ දැක්වීම රූපකයේ ලක්ෂණය යි.

වැඳ ඔහු පද කමල
තමා ආ තතු කී ය මූසිල

මෙහි පාදය පද්මයක් මෙනැයි නො පවසා මූසිල ගුත්තිල පඬිතුමාගේ පාද පද්ම වැඳි බව දැක් වේ. මෙහි පදකමල යනු රූපකයකි. පාදයත් කමලත් එකක් සේ සලකා ඇත.

### උත්ප්‍රේක්ෂාලංකාරය

පණ ඇති හෝ පණ නැති හෝ වස්තුවක පවත්නා ස්වාභාවිකත්වය කවියා දැන දැන ම ඊට වෙනස් අයුරකින් කල්පනා කිරීම උත්ප්‍රේක්ෂාලංකාරය යි.

නුපුබුදු තැඹිලි මල්
ඇගෙ දඟ යුගට මනකල්
පැරද සැඟවුණු තුල්
කොළපු ඇතුළට පිවිසි හැම කල්

කාන්තාවගේ දඟ යුගෙහි ශෝභාව දුටු තැඹිලි මල ලජ්ජා වී කොළපුව තුළට වී සැඟවුණු බව කවියා කල්පනා කරයි.

### ස්වභාවෝක්ති අලංකාරය

වස්තුවක නියම ස්වභාවය ඇති සැටියෙන් ම වර්ණනා කිරීමයි.

පැසෙයි නිබඳ සුවඳැල් කෙත්වත් අවට
ඇසෙයි ළමා වසුපැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට
රසෙයි අමා රස ම ය ඒ පියස දුට

### අතිශයෝක්ති අලංකාරය

ලෝකස්වභාවය ඉක්මවා පැවසීම අතිශයෝක්තිය යි.

සිහිල් සපු සුවඳ ගෙන එන උයන්වල
සිහිල් නෙලෙන් හඬවන මිණිකිකිණි කැල
විපුල් රත් සෙමෙර බඳ රන් දද සසල
ළකල් මෙපුර තුළ වලහා රිවි තැවුල

## ධ්වනිතාර්ථය

කවියාගේ පරමාර්ථය රස නිෂ්පත්තියයි. ඔහු රස නිපදවන්නේ වචන උදවු කරගෙන ය. මිනිසා තම ප්‍රීතිය, ශෝකය, කෝපය, කුතුහලය ආදි හැඟීම් පළ කිරීම සඳහා වචන භාවිත කරයි.

කිසියම් නිර්මාණයක වචනයෙන් පැවැසෙන අර්ථයට වැඩියෙන් ප්‍රතීයමාන වන හෙවත් වැටහෙන අර්ථය, ධ්වනිතාර්ථය වශයෙන් ද වචනයෙහි මතු පිට අර්ථය වාච්‍යාර්ථය වශයෙන් ද හැඳින්වේ. කවියාට වඩාත් ප්‍රයෝජනවත් වන්නේ අරුත කෙළින් ම නො පවසන ව්‍යංග්‍යාර්ථවත් වචන ය. ව්‍යංග්‍යාර්ථවත් වචන උචිත පරිදි භාවිතයෙන් කවියාට පාඨකයා තුළ තමා ඉපදවීමට බලාපොරොත්තු වන අදහස් හා හැඟීම් වඩාත් රමණීය ලෙස ඉදිරිපත් කළ හැකි ය. ඇතැම් කාව්‍ය කියවා වචනයෙන් වචනය ගෙන බලන විට නො පෙනෙන, එනමුත් ඒ වචන සියල්ල සමස්තයක් වශයෙන් ගත් විට පමණක් පෙනෙන චමත්කාරජනක හැඟීම් රාශියක් පාඨකයා තුළ ජනිත වෙයි. ඒ හැඟීම් පහළ වන්නේ ඉහතින් සඳහන් කළ ව්‍යංග්‍යාර්ථයේ බලයෙනි. ව්‍යංග්‍යාර්ථය ධ්වනිතාර්ථය වශයෙන් ද හඳුන්වනු ලැබේ. පහත දැක්වෙන උදාහරණය දෙස බලන්න.

"කටුරොද මඩවගුරුවල මානෙල් ඕලු
මැණිකෙගෙ මුහුණ දැකුමට පොරකන වාලු"

සුදෝසුදු කාව්‍යයෙහි ඇතුළත් මේ කවියෙන් වාච්‍යාර්ථය අබිබවා අර්ථ රසක් කියැවෙන්නට ඉඩ හැර ඇත. මෙහි මැණිකෙගේ ලස්සන ව්‍යංග්‍යයෙන් ප්‍රකාශ වෙයි.

### 10.1 ක්‍රියාකාරකම 1

1. පද්‍යයක ශබ්ද රසය ඇති කිරීම සඳහා උපකාරී වන අංග කීයක් මෙහි දැක්වේ ද? ඒවා හඳුන්වන්න.
2. නව නළු රස නම් කරන්න.
3. කාව්‍යයක "රසය" පිළිබඳ ව මේ ලේඛකයා දක්වන අදහස් පැහැදිලි කරන්න.
4. උපමාලංකාරය හා රූපකාලංකාරය අතර වෙනස උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

## 10.2 ක්‍රියාකාරකම් 2

පාඩමෙහි ඇතුළත් කරුණු සැලකිල්ලට ගෙන පහත දැක්වෙන පද්‍ය පන්ති පිළිබඳ රසාස්වාදයක් ලියන්න.

**මියගිය උවැසිය**

i.

පිරුවානා පොත් වහන්සෙ
කනප්පුවෙහි පෙරළී ඇත
මිදුල පුරා වියළුණ කොළ
ඒ මේ අත විසිර තිබේ.
මිදුලෙ පහන් පැලේ නිතර
සැලුණු දැල්ල නිවී ගොස් ය.
ඉඳහිට ගේ පිළිකන්නේ
බල්ලකු උඩුබුරනු ඇසේ.

මහාචාර්ය විමල් දිසානායක

ii

පවුලේ බර අඩු කරන්ට ගෙදරින් පිට වන්නට පෙර
මතක ද අම්මේ ඔබ මට ඇමතුවෙ පොඩි දුවේ කියල
ජීවිතයේ පළමු වරට තනි වුණු කල ඈත රටක
එහි මිනිසුන් හුඟ දෙනෙක් ම මට කීවේ ලිසී කියල

අතින් හිසින් බර උසුලන් පාර දිගේ මං යන කොට
දකින කෙනෙක් මට කිව්වේ ඒ වැඩකාරියක් කියල
පොඩි දරුවකු අතින් අරන් පාසලකට මං යන කොට
එතන හිඳින අය කිව්වේ බේබිගේ ආයම්ම කියල

කෑම බීම උයා පිහා මං දර දිය අදින කලට
දකින සියලු දෙනා කිව්වෙ ගෙදර කුස්සි අම්ම කියල
ඒත් අම්මෙ දවස ගෙවිල නිදිපැදුරේ ඇල වුණාම
තව මත් සිහිනෙන් උඹ මට කියන්නේ පොඩි දුවේ කියල

මොනිකා රුවන්පතිරණ

## 10.3 ක්‍රියාකාරකම 3

**පහත දැක්වෙන කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.**

රූ රුසේ අදිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක් වන ලෙසේ වෙණ නාදනු පා තබ තබා
කම් පසේ දෙන සැර ලෙසේ දෙස බලබලා නෙත'ගින් සබා
මම් කෙසේ පවසම් එසේ වර සුර ළඳුන් දුන් රඟ සොබා

1. කවියෙහි සඳහන් දිදී, බලබලා, තබතබා යන පද කුමන ක්‍රියාපද වර්ගයට අයත් ද?
2. එම ක්‍රියාපද තවත් ආකාරයකින් ලියා දක්වන්න.
3. මෙහි ඇතුළත් කෘදන්ත පද දෙකක් ලියා දක්වන්න.
4. නාදනු, නෙතගින් යන පද විසන්ධි කරන්න.
5. කවියේ ඇතුළත් උත්තම පුරුෂ නාම පදය ඇතුළත් කවි පදය ලියන්න.

## 10.4 ක්‍රියාකාරකම 4

'තද්භව' සහ 'තත්සම' වචන ලේඛන ව්‍යවහාරයේ දී භාවිතයට ගනු ලැබේ. තද්භව යන්නෙන් හඳුන්වන්නේ පාලි, සංස්කෘත ආදි විවිධ භාෂාවලින් සිංහලයට බිඳී ආ වචන ය. තත්සම යනු වෙනසක් නැතිව මුල්භාෂාවේ සවරූපයෙන් ම භාවිත කරන පදයි. ඒවා සිංහලයට ඒමේ දී වෙනස් නො වේ.

පුරාතන සිංහල පද්‍ය රචකයන් ස්වකීය නිර්මාණ සඳහා වචන තෝරාගැනීමේ දී බොහෝ විට හුදු හෙළ වදන් භාවිතයට උත්සාහ ගත් බව පෙනේ. ගද්‍ය රචකයන් හුදු හෙළ වදන් මෙන් ම මිශ්‍ර සිංහල වචන ද යොදාගෙන ඇත. මේ මිශ්‍ර සිංහල වචන නම් පාලි, සංස්කෘත ආදි භාෂාවලින් ලැබුණු ඒවා යි. නිදසුනක් ලෙස ගද්‍යයේ දී යෙදෙන"ස්වභාවධර්මය" යන්න පද්‍යයේ දී " සොබාදහම" ලෙසින් භාවිත වන ආකාරය දැක්විය හැකි ය. පහත දැක්වෙන නිදසුන් විමසා බලන්න.

**උදාහරණ :**

| ගද්‍ය භාෂාව | පද්‍ය භාෂාව |
|---|---|
| අර්ථ | අරුත් |
| අභිෂේක | අබිසෙස් |
| දක්ෂිණ | දකුණු |
| ධර්ම | දහම් |
| ගන්ධර්ව | ගඳඹ |
| මනුෂ්‍ය | මිනිස් |
| ප්‍රදක්ෂිණා | පැදකුණු |
| ප්‍රතිසංස්කරණ | පිළිසකර |
| පූර්ව | පෙර |
| ගම්භීර | ගැඹුරු |

## 10.5 ක්‍රියාකාරකම 5

1. **පහත දැක්වෙන වචන පද්‍ය භාෂා ව්‍යවහාරයට යෝග්‍ය වන සේ ලියා දක්වන්න.**

| | |
|---|---|
| 1. ත්‍රිපිටක ධර්මය | 2. දන්තධාතු මන්දිරය |
| 3. දුට්ඨගාමිණී | 4. පරාක්‍රමබාහු |
| 5. ශක්‍ර දිව්‍යරාජයා | 6. පාණ්ඩුකම්බල ශෛලාසනය |
| 7. චන්ද්‍ර දිව්‍යරාජයා | 8. සූර්යමණ්ඩලය |
| 9. ආකාශගංගාව | 10. ඒකච්ඡත්‍රකොට |
| 11. ඉන්ද්‍රනීල මාණික්‍යය | 12. බුද්ධරශ්මිය |
| 13. රාජාඥාව | 14. පංචශීලය |
| 15. ආඥාචක්‍රය | |

2. **පහත දැක්වෙන වචන තත්සම හෝ තද්භව හෝ යන දෙකෙන් එක් ආකාරයකට සකස් කර ලියන්න.**

| | |
|---|---|
| 1. පාඨශාලා වත්ත | 2. අහස් යාත්‍රාව |
| 3. බස් රථය | 4. උද්‍යාන බිම |
| 5. පරිත්‍රාණ දෙසුම | 6. වර්ෂා කල |
| 7. ප්‍රථම තෑග්ග | 8. සරු භූමියක් |
| 9. ගන්ධ කිළිය | 10. රජ මන්දිරය |

## 10.6 ක්‍රියාකාරකම 6

**රචනයක් ලියමු.**

“මා දුටු ශෝකජනක සිද්ධියක් -’’

**සංකල්පනා**

ඉතා ම සාරභූමිය පවා වගා
නොකළ හොත් වල් පැළවලින්
පිරී යනු ඇත.

**ප්ලූටාර්ක්**